


# සියල්ල කර්මයෙන් සිදු නොවේ

මිනිස්සු නිරතුරු ව ම ජීවිතය, ලෝකය හා සමාජය පිළිබඳ ව එක් පැත්තකින් පමණක් බලති; විමසති; අදහස් දක්වති; නොයෙක් පැතිවලින් නොබලති; නොවිමසති; කථා නොකරති. මෙය යම් ගැටලුවක් පිළිබඳ ව අසම්පූර්ණ අවබෝධයක් ඇති වීමට හේතු වේ. සත්‍ය දැකීමට බාධාවක් වේ. එම පිළිවෙත බුදු දහමෙහි හැඳින්වෙනුයේ **ඒකංගදස්සී** වීම යනුවෙනි. එය බුදු දහම ප්‍රිය නොකරයි; එය ගැටුම් ද උපදවයි. බුදුරජාණන් වහන්සේ ඒක හේතුවාදී නොවූහ, බහු හේතුවාදී වූහ. ඒකංගදස්සී නොවූහ. **අනේකංගදස්සී** වූහ. එනම් එක් පැත්තකින් පමණක් නොබලා ගැටලුව දෙස නොයෙක් පැතිවලින් බැලීමයි. නියාම ධර්ම පිළිබඳ බුද්ධ දේශනාව මීට එක් නිදසුනකි.

මෙලොව ජීවත් වන කාලය තුළ අපට සැප, සතුට මෙන් ම දුක් කරදර ද විඳීමට සිදු වෙයි; අප විවිධ රෝගාබාධවලට ද ගොදුරු වෙයි. බලාපොරොත්තු කඩවීම්වලට මුහුණ දීමට අපට සිදු වෙයි. පොදුවේ ගත් කල ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රශංසා, සැප-දුක යන අටලෝ දහමට ම මුහුණ දීමට අපට සිදුවෙයි. ඒ සියල්ල එක් හේතුවක් නිසා ම සිදු නොවන බව බුදු දහම උගන්වයි.

බුද්ධ කාලීන භාරතයේ විසූ ඇතැම් ආගමික ශාස්තෘවරුන් දේශනා කළේ අනුව සියල්ල සිදුවන්නේ ඊශ්වර නිර්මාණවාදය අනුවයි. එනම් සර්ව බලධාරී දෙවියකුගේ මැවීම අනුව බවයි. තවත් සමහර ශාස්තෘවරුන්ට අනුව සියල්ල සිදුවන්නේ පූර්ව කර්මයට අනුවයි. සමහර ශාස්තෘවරුන් විසින් උගන්වන ලද්දේ සියල්ල ඉබේ සිදුවන බවයි. ඔවුන් සියලු දෙනා ම හැඳින්විය හැක්කේ එක් පැත්තකින් පමණක් අදහස් දක්වන්නවුන් ලෙස ය. ඒකංගදස්සී චින්තකයන්

ලෙස ය. එසේ නැත්නම් එක් හේතුවක් පමණක් දකින ඒක හේතුවාදීන් ලෙස ය.

බුදු දහමේ නියාම ධර්ම පිළිබඳ ඉගැන්වීමෙන් සියල්ල කර්මය නිසා ම සිදු නොවන බව පෙන්වා දී ඇත. බුදු දහමට අනුව ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රශංසා, සැප-දුක ලබා දෙන නියමයන් පහක් ඇත. ඒවා නියාම ධර්ම ලෙස හඳුන්වයි.

01. උතු නියාමය - කාලගුණික හේතු
02. බීජ නියාමය - උද්භිද විද්‍යාත්මක හේතු
03. කම්ම නියාමය - කර්මානුරූප හේතු
04. ධම්ම නියාමය - ලෝක ධර්මතා ආශ්‍රිත හේතු
05. චිත්ත නියාමය - සිතුවිලි මුල් කොටගත් හේතු

## උතු නියාමය

හේමන්ත, ගිම්හාන හා වස්සාන යනුවෙන් සෘතු තුනකි. මෙම සෘතු අනුව ලෝකයේ හා පුද්ගල ජීවිතයේ ඇතිවන වෙනස්කම් උතු නියාම නම් වේ. ගස් වැල්වල කොළ හැලීම, දලු දැමීම, මල් පිපීම, ගෙඩි හට ගැනීම ආදිය ද, මහ මුහුදෙහි වඩදිය බාදිය ඇතිවීම, ගං වතුර, නාය යාම්, සුළි සුළං, ගිනි කඳු පිපිරීම්, ලැව් ගිනි උතු නියාමයට අනුව සිදු වේ. මෙවැනි සිදුවීම් දෙවියන්ගේ බලපෑමෙන් හෝ පූර්ව කර්මයෙන් හෝ අහේතුක ව හෝ සිදු නොවන බවත් වෙනස් වන කාලගුණයට අනුව සිදුවන බවත් මෙහි දී සැලකේ. එසේ ම සත්ත්ව ජීවිතය හා බැඳුණු වෙනස්වීම් ද උතු නියාමය අනුව සිදු විය හැකි ය. නිදසුනක් වශයෙන් අධික සීතල ප්‍රදේශයකට ගිය විට යමෙකු ඒ හේතුවෙන් රෝගී වීම, උෂ්ණාධික ප්‍රදේශයකට ගිය විට අධික උෂ්ණය නිසා රෝගී වීම කර්මානුරූප ව හෝ වෙනත් හේතුවක් නිසා ම වන්නේ යැයි කිව නොහැක. එසේ ම ගිම්හාන සමයෙහි මෙන් ම වස්සාන සමයෙහි හෝ හේමන්ත සමයෙහි විඳීමට සිදුවන සුව දුක් ද උතු නියාමය අනුව සිදු වේ. මල් කොළ ආදියේ වර්ණය වෙනස් වීම තුරු ලතාවල අස්වනු අඩු වැඩි වීම ආදිය ද කාලගුණය හෙවත් උතු නියාමය අනුව සිදු විය හැකි ය.

## බීජ නියාමය

බීජ නියාමය යනු උද්භිද ලෝකයෙහි වෙනස්කම්වලට තුඩු දෙන නියමයන් ය. බීජ ජාතීහු පස් ආකාර වෙති. මූල බීජ, ඛන්ද බීජ, අග්ග බීජ, ඵළු බීජ, බීජ බීජ යනුවෙනි. මුල්වලින් පැළ වන්නේ මූල බීජයි. කඳින් පැළ වන්නේ ඛන්ද බීජයි. දල්ලෙන් පැළ වන්නේ අග්ග බීජයි. පුරුක්වලින් පැළ වන්නේ ඵළු බීජයි. ඇටයෙන් පැළ වන්නේ බීජ බීජයි. මෙම ආකාර පහෙන් එකකින් තුරුලතාවෝ හට ගැනෙති. එය බීජ නියාමයයි. එසේ ම එකී තුරුලතාවන්ගේ ඇතිවෙන වෙනස්කම් ද මල් ගෙඩි ආදියෙහි දුගඳ හෝ සුගඳ, වර්ණය, රසය බීජ නියාමය අනුව ම සිදු වේ. ඒවායේ හැඩයට බලපාන්නේ ද එම නියාමයයි. උද්භිද විද්‍යාත්මක ව ඇතිවන ඉහත කී වෙනස්කම් දේව බලය අනුව හෝ කර්මය අනුව හෝ අහේතුක ව හෝ සිදු නොවන බවත් බීජ නියාමය අනුව ම සිදුවන බවත් බුදු දහම පෙන්වා දෙයි.

## ධම්ම නියාමය

ලෝකයේ ස්වභාව ධර්මය අනුව මෙන් ම ආශ්චර්ය, අද්භූත හේතු අනුව ද ඇති වන වෙනස්කම් ධම්ම නියාම නම් වේ. ස්වභාවයෙන් ම සිදුවන ඇති වීම, පැවැත්ම හා නැති වීම ද ධම්ම නියාමයයි. දරුවෙකු තරුණයකු වීම, තරුණයකු මැදිවියට එළඹීම, මැදිවියෙහි සිටින්නෙකු මහලු වීම ධම්ම නියාමයයි. එසේ මහලු වූ තැනැත්තාගේ කෙස් සුදු වීම, දත් වැටීම, හම රැලි වැටීම, ඉන්ද්‍රිය දුබල වීම, අවසානයේ මිය යාම ජීවිතයට අයත් ධර්මතාවෝ ය. ඒවා ද ධම්ම නියාමයට අයත් ය. හිරු සඳු අහසෙහි නැග ඒම හා බැස යාම, ජලය ඉහළින් පහළට ගලා යාම ආදිය ද ඊට ම අයත් ය.

ලොවට මහත් වැඩ සිදු කරන මහා පුරුෂයන් පහළ වීමේ දී, අභාවයට යාමේ දී සිදුවන අසිරිමත් සිදුවීම් ද ධම්ම නියාමයට අයත් ය. බෝසතුන්ගේ ඉපදීම, බුද්ධත්වය, දම්සක් දෙසුම, පරිනිර්වාණය වැනි අවස්ථාවල ධම්ම නියාමය අනුව බොහෝ අසිරිමත් සිදුවීම් සිදුවුණ බව සැලකේ. දිය ගොඩ දෙකේ ම අකාල පුෂ්ප හට ගැනීම, ලවණ සාගරය රසවත් වීම, නරකයෙහි ගිනි නිවී යාම, ජාත්‍යන්ධයන්ගේ ඇස් පෙනීම, සංගීත භාණ්ඩ ඉබේ වාදනය වීම ආදි අසිරිමත් සිදුවීම් ධම්ම නියාමයට අයත් බව පුරාණාචාර්යවරු පවසති.

## චිත්ත නියාමය

චිත්ත චෛතසිකයන්ගේ ක්‍රියාකාරීත්වය අනුව සිදුවන වෙනස්කම්, ලැබෙන සුව දුක් ආදිය චිත්ත නියාමයට අයත් ය. අකුසල පක්ෂයේ චිත්ත චෛතසික අනුව මෙන් ම කුසල පක්ෂයෙහි චිත්ත චෛතසික අනුව ද වෙනස්කම් ඇති විය හැකි ය. අතිශයින් ම දුක් සහිත වූ, කටුක වූ සිතුවිලි නිසා මිනිසුන්ගේ කයෙහි ද, හැසිරීමෙහි ද වෙනස්කම් ඇති විය හැකි ය. එසේ ම අතිශයින් සොම්නස් සහගත වූ සුවදායක සිතුවිලි නිසා ද එබඳු වෙනස්කම් ඇතිවිය හැකි ය. මෙකී චිත්ත නියාමය අනුව සිදුවන ක්‍රියාකාරකම් ඉතා සියුම් ය; විසිතුරු ය. චිත්ත නියාමය වටහා නොගත් සත්ත්වයෝ එයට පුද්ගලත්වයක් ආරෝපණය කරමින් මම ය, මාගේ ය යන දෘෂ්ටියට යොමු වෙති. මිනිසුන්ගේ සිත විසින් ලෝකය හසුරුවනු ලැබේ. සියල්ලෝ සිත නැමැති එක ම ධර්මතාවට, චිත්ත නියාමයට යටත් ව සිටිති. ඇස, කන ආදි ඉන්ද්‍රියයන් හා රූප, ශබ්ද ආදි අරමුණු ඉපදීමෙන් සිත ක්‍රියාත්මක වේ. චිත්ත පරම්පරා පහළ වේ. මේ සියල්ල ම චිත්ත නියාමයට අයත් ය.

## කම්ම නියාමය

කුසලාකුසල කර්ම අනුව ජීවිතයක සිදුවන වෙනස්කම්, ලැබෙන දුක් සැප ආදි ඵල විපාක කම්ම නියාමයට ඇතුළත් ය. කර්ම විපාක වශයෙන් ඇති වන වෙනස්කම් මින් අදහස් වේ. කර්ම රැස් කරන්නේ තිදොරින් ය. කර්මයක් සම්පූර්ණ වීමට චේතනාවක් ද සම්පූර්ණ විය යුතු ය. එසේ ම ඒ සඳහා කායික ක්‍රියා ද උපකාරී වේ. එබඳු කර්මවල ඵල විපාක ඇත. සිතාමතා කරනු ලබන ඵල විපාක සහිත ක්‍රියාව කර්ම ගණයට වැටේ. එකී කර්මානුරූප ව ඇති වන ප්‍රතිඵල හෙවත් වෙනස්කම් කම්ම නියාමය නම් වේ. කර්මය සත්ත්වයා උස් පහත් වශයෙන් බෙදයි. පර පණ නසන්නා අඩු වයසින් මිය යයි. එම පාප කර්මය නොකරන්නා දිගාසිරි ලබයි. මසුරු තැනැත්තා දිළින්දෙක් වේ. නොමසුරු තැනැත්තා පොහොසතෙක් වේ. සත්ත්වයන්ට හිංසා කරන්නා රෝගියෙක් වේ. එසේ නොකරන්නා නීරෝගී වේ. මේ ආකාරයෙන් කර්මානුරූප ව දුක් සැප ඇති කරමින් වෙනස්කම් සිදු වන්නේ කම්ම නියාමය අනුව ය. ප්‍රමාණයෙන් ජලය වැඩි බඳුනකට ලුණු කැටයක් දැමූ විට ලුණු රසය අඩු වේ. ජලය අඩු බඳුනකට දැමූ විට රසය වැඩි වේ. එලෙසින් කුසල කර්ම බලවත් වන කල්හි දුර්වල වූ අකුසල කර්මවල විපාක අවම වේ.


අකුසල කර්ම බලවත් වූ විට කුඩා කුසල කර්ම යටපත් වේ. එසේ වන්නේ කර්ම නියාමය අනුව ය.

බුදුරජාණන් වහන්සේ රෝග හටගන්නා ක්‍රම අටක් පිළිබඳ ව ගිරිමානන්ද සූත්‍රයේ දී දේශනා කළහ.

| | |
|---|---|
| 01. පිත්ත සමුට්ඨානා ආබාධා | - පිත කිපීමෙන් හට ගන්නා ආබාධ |
| 02. සෙම්හ සමුට්ඨානා ආබාධා | - සෙම කිපීමෙන් හට ගන්නා ආබාධ |
| 03. වාත සමුට්ඨානා ආබාධා | - වාතය කිපීමෙන් හට ගන්නා ආබාධ |
| 04. සන්නිපාතිකා ආබාධා | - අනුන්ගෙන් බෝවීමෙන් හට ගන්නා ආබාධ |
| 05. උතුපරිනාමජා ආබාධා | - ඍතු විපර්යාස නිසා හට ගන්නා ආබාධ |
| 06. විසම පරිහාරජා ආබාධා | - වැරැදි පුරුදු නිසා හට ගන්නා ආබාධ |
| 07. ඔපක්කමිකා ආබාධා | - විවිධ උපක්‍රම නිසා හට ගන්නා ආබාධ |
| 08. කම්ම විපාකජා ආබාධා | - කර්ම විපාක නිසා හට ගන්නා ආබාධ |

සියලු රෝගාබාධ වැලඳෙන්නේ ද කර්මය නිසා ම නොවේ. ඉහත කී පරිදි ඊට බලපාන වෙනත් හේතු ගණනින් වැඩි ය. කර්මයේ බලපෑම අටෙන් එකක් පමණි.

මෙසේ සියල්ල කර්මයෙන් ම සිදු නොවේ. කර්මානුරූප රෝගාබාධ යැයි කිව හැක්කේ ඇතැම් රෝගාබාධයන්ට පමණි. කර්මානුරූප යැයි හැඳින්විය හැක්කේ ජීවිතය හා ලෝකය පිළිබඳ සමහර වෙනස් වීම් හා සැප දුක් පමණි. සියල්ල කර්මයෙන් සිදු වේ යැයි සැලකීම කර්ම නියතියට යටත් වීමකි. බුදු දහම කවර ආකාරයක හෝ නියත ධර්මතාවක් නොපිළිගනී. යහපත් අනාගතයක් ඇති නුවණැති බෞද්ධ දරුවන් වන අප ද කර්මය හා විපාකය පිළිගත යුතු ය. එහෙත් එය ම නියතියක් කොට ගෙන එයට ම යටත් වීම අපේ දියුණුවට බාධාවකි. එය බුදු දහමට ද පටහැනි ය. කර්මය වෙනස් කළ හැකි ය. එසේ ම එය ඉක්මවා යා හැකි ය. ඒ සඳහා අවශ්‍ය වන්නේ අධිෂ්ඨානය, වීර්යය හා කැපවීමයි; බුදුරදුන් වදාළ මග ඔස්සේ ගමන් කිරීමයි. එසේ කර්මය ඉක්මවා යාම කම්මක්ඛය නම් වේ. එයම සසරින් මිදීමයි; නිවනයි.



## සාරාංශය

- සියල්ල සිදු වන්නේ පෙර කරන ලද කර්ම විපාක අනුව ය යන ඉගැන්වීම බුදු දහම නොපිළිගනී.
- කර්මයට අමතර ව උතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම යන නියාම ධර්ම ලෝකයේ ක්‍රියාත්මක වේ.
- වීර්යවන්ත, මනා සිහි ඇති, නිවැරැදි ජීවන මගක යන පුද්ගලයාට කර්මයට ගැති නොවී ජීවිතය ජය ගත හැකි ය.



## ක්‍රියාකාරකම

1. නියාම ධර්ම ලියා ඒවායේ කෙටි අර්ථය සඳහන් කරන්න.
2. ඔබට කර්මය වෙනස් කළ හැකි ය. එසේ වෙනස් කිරීමට ඔබ විසින් වර්ධනය කර ගත යුතු ගුණධර්ම තුනක් නම් කරන්න.



## පැවරුම

විභාගයෙන් අසමත් වූ ඔබේ මිතුරා දුක් වූයේ "මෙය මාගේ කර්මය" යැයි කියා ය. එය නොපිළිගන්නා ඔබ ඔහු ධෛර්යවත් කිරීමට දිය හැකි උපදෙස් ලියන්න.